07.02.2018

**<u>මාධ්‍ය ප්‍රකාශනයයි</u>**

**<u>අති පූජනීය මහාචාර්ය බෙල්ලන්විල විමලරත්න නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙ අපවත් වීම පිලිබඳ ගෝලීය ශ්‍රී ලාංකික සංසදයේ ශෝකය ප්‍රකාශ කිරීමයි.</u>**

සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ගෞරවයට පාත්‍රවූ අති පූජනීය මහාචාර්ය බෙල්ලන්විල විමලරත්න ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙ හදිසි අභාවය සියළු ශ්‍රී ලාංකිකයන්ගේ සිත්සතන් කම්පා කිරීමට හේතුවක් වූ බව කිව යුතු නැති අතර අප,ගෝලීය ශ්‍රී ලාංකික සංසදය අපගේ හදපත්ලෙන් නැගෙන්නාවූ ශෝකය හා සංවේගය මෙයින් ප්‍රකාශ කරමු.

වර්ෂ 1942 අප්‍රේල් 14 වනදා බෙල්ලන්විල ග්‍රාමයේදී උපත ලැබ වර්ෂ 1958 පෙබරවාරි 28 වැනිදා එවකට බෙල්ලන්විල රජමහා විහාරයේ මහානායක අති පූජ්‍ය බෙල්ලන්විල සෝමරත්න ස්වාමීන්ද්‍රයන් වහන්සේ යටතේ පැවිදි වූ උන්වහන්සේ පසු කලකදී පාලි භාෂාව පිලිබඳ ගෞරවය උපාධියක්ද ලැබ බෞද්ධ ශාසනයට හා ගිහි සමාජයට මහත් මෙහෙවරක් කල ස්වාමීන් වහන්සේ නමකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති පදවිය ඉසුලු උන්වහන්සේ ජාතික ගැටළු වලදී ජාති හා පක්ෂ බේදයකින් තොරව තම මතය, ශ්‍රී ලාංකිකයන් හා තම මවු රටේ අභිවෘද්ධිය වෙනුවෙන් නොබියව හඬ නැගූ අතර දේශීය හා විදේශීයව බුදුදහම ව්‍යාප්ත කිරීමට මහත් වෙහෙසක් ගත් හා තම ශ්‍රමය වැය කල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමකි.

ජීවිතය අනියතයි මරණය නියතයි යන බුදුවදනට අනුව උන්වහන්සේ තම දිවි ගමන නිම කලත් අප මව්බිම, බෙදුම්වාදී අභියෝගයන් හට මුහුණ දී ඒකීය භාවය අනතුරට ලක්ව ඇති මේ මොහොතේ උන්වහන්සේගේ අභාවය විදේශගත සියලුම දේශප්‍රේමී ජනතාවගේ ඉමහත් ශෝකයට හේතුවන බව අප ගෝලීය ශ්‍රී ලාංකික සංසදය හද පිරි ශෝකයෙන් යුතුව මෙයින් ප්‍රකාශ කරමු.

අති පූජනීය මහාචාර්ය බෙල්ලන්විල විමලරත්න ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිවන් සුව අත් වේවා.

මෙයට,

රංජිත් සොයිසා

මාධ්‍ය ප්‍රකාශක,
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය.